## තල් සංවර්ධන මණ්ඩලයේ - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින්, 2012 දෙසැම්බර් 31 දිනට තල් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු.10,328,337 ක වටිනාකමවූ ගොඩනැගිලි හා සවිකිරීම් පිරිවැය, වෙනත් ගොඩනැගිලි / ඉඩම්, සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේ වුවද එම ඉඩම් හා ගොඩනැගිලි මණ්ඩලයට අයත් ඒවා නොවුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.5,528,147 ක් වූ සමුච්චිත ක්ෂය සඳහා ප්‍රතිපාදනයන් කර තිබුණි.

(ආ) රු.3,367,515 ක් පිරිවැය වූ කරෙයිනගර් හි කර්මාන්ත සංකීර්ණ ගොඩනැගිල්ල සහ රු.1,131,225 ක් පිරිවැය වූ ඩෙල්ෆ්ට්හි කෙදි ( Fiber ) මධ්‍යස්ථානය ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබූ අතර සමුච්චිත ක්ෂය සඳහා පිළිවෙලින් රු.1,951,376 ක් සහ රු.339,366 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වුවද මෙම ඉඩම්වල අයිතිය මණ්ඩලය සතු නොවීය.

(ඇ) රු.48,107,122 ක් පිරිවැයවූ ජංගම නොවන වත්කම් වෙනත් වත්කම් ලෙස සාවද්‍යව වර්ගීකරණය කර වාර්ෂිකව සියයට 20 බැගින් අනුපාතයකට ක්ෂය කර තිබුණි.

(ඈ) රු.20,395,447 ක් වූ තල් බීජ වගාකිරීමේ පිරිවැය වෙනත් මූල්‍ය වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබූ අතර විධිමත් ගිණුම්කරණ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

### 1.2.2 නොසැසඳු පාලන ගිණුම්

පාලක මණ්ඩල සමාජික වියදම්, අතිකාල ගෙවීම්, ගමන් වියදම් ගෙවීම, වැටුප් පාලන ගිණුම් හා ක්ෂය ආදියෙහි උපයෝගී ලෙජර ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ශේෂයන් අතර රු.23,145,291 ක් වූ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ කාර්ය මණ්ඩල සාමාජිකයකුගෙන් ලැබිය යුතු රු.119,320 ක් වූ අත්තිකාරමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ කාර්යාලයෙන් කොටසක් සමාජ සේවා අමාත්‍යාංශයට උප බදු දී තිබුණු නමුත් රු.1,220,000 ක් වූ හිඟකුලිය අදාල පාර්ශවයෙන් අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද, මෙම මුදල අදාළ ගණන්දීමේ නිලධාරීගේ විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2011 වර්ෂයේදී ලියාහැර තිබූ අතර 2012 ජුලි 09 දින පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දී තිබූ නියෝගය ක්‍රියාත්මක කිරීමට 2013 ජුලි 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු මුදලින් ගෙවිය යුතු මුදල් අඩුකිරීමෙන් පසු රු.2,464,642 ක් වූ ශුද්ධ මුදලක් පෙර වර්ෂයේ ගැලපීම් ලෙස 2011 වර්ෂයේදී පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පමණක් ලියාහැර තිබුණි. මේ සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු ආරම්භ කිරීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝග කර තිබුණද, නිවැරදි මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එම මුදල අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ දෙකකට වැඩි කාලයක් වූ රු.26,308 ක ණය හිමි ගිණුම් 05 ක් නිරවුල් කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) 1991 සිට 2010 දක්වා කාල පරිච්ඡේදය සඳහා එකතුව රු.1,665,344 ක් වූ විගණන ගාස්තු බිල්පත්‍ර ලැබී තිබුණද, ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමට වර්ෂ 09 ක කාලයක් පියවර ගෙන නොතිබුණි.

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ඉඩම් ඔප්පු , ස්ථාවර වත්කම් ලේඛනය , ගෙවීම් වවුචර් , දෛනික ධාවන වාර්තා සහ ලොග් පොත්, ගිවිසුම් ආදිය නොමැතිවීම හේතුවෙන් ගිණුම්වල පැවත එකතුව රු.59,448,010 ක් වූ විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**1.2.5 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

**(අ) පනත්**

(i) 1971 අංක 38 දරන මුදල් පනතේ 12 සහ 14(3) වගන්ති

(ii) 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනතේ II කොටසේ 6(2)(6) වගන්තිය

(iii) 1979 අංක 01 දරන පාර්භෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත

**(ආ) මුදල් රෙගුලාසි**

අංක 110, 135, 272(3), 350 371(2)(ආ) , 382, 383,445,446, 715, 751(1), 756(3), 756(5), 757(1)(ඇ), 757(2)(අ), 757(2)(ඇ) 850(i) , 1010(ආ), 1644, 1646 හා 1654(ආ)

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

(i) VIII පරිච්ඡේදයේ 03 වගන්තිය

(ii) XII පරිච්ඡේදයේ 05 වගන්තිය

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ( LKPSAS)**

අංක 01 හා 02

**(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006**

(i) 05 පරිච්ඡේදයේ 5.3.5 වගන්තිය
(ii) 02 පරිච්ඡේදයේ 2.6.1 වගන්තිය

**(ඊ) චක්‍රලේඛ**
---------
(i) 2008 අගෝස්තු 15 දිනැති අංක 51 දරන හා 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ
(ii) 1996 අප්‍රේල් 20 දිනැති අංක එම්පී/6/1/96 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.4.1 ඡේදය

**(උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**
--------------------------------------------------------------------------------
4.2.2 හා 4.2.5 ඡේදය

**1.2.6 බලය නොලත් ගනුදෙනු**
-------------------------
සමාලෝචිත වර්ෂය සඳහා රු.24,048,000 ක මුදලක් මූලධන වියදම් සඳහා ලැබී තිබුණද, මෙම ප්‍රතිපාදනයෙන් රු.157,389 ක මුදලක් විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් තොරව පුනරාවර්තන වියදම් සඳහා උපයෝජනය කර තිබුණි.

**1.2.7 අවිධිමත් ගනුදෙනු**
--------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සභාපති විසින් සමාලෝචිත වර්ෂයේ ඉන්ධන වියදම් රු.619,607 ක් සීමාව ඉක්මවා ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

(ආ) තල් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාට පාලක මණ්ඩලයේ 03 වැනි රැස්වීමේ සිට 12 වැනි රැස්වීම දක්වා ලේකම් ලෙස කටයුතු කිරීමට අවසර ලබාදී තිබූ අතර ඉහත සඳහන් 2003 ජුන 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 ඡේදයට පටහැනිව රැස්වීම් 10 කට සහභාගිවීම වෙනුවෙන් ලේකම් සඳහා වූ දීමනාවක් ලෙස 2012 දෙසැම්බර් 08 දින රු.20,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) 2008 අගෝස්තු 15 දිනැති අංක පීඊඩී/51 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ නිරීක්ෂකයින් තිදෙනෙකුට රු.107,750 ක දීමනා ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම සඳහා ලැබුණු රු.55,664,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.9,763,832 ක ශුද්ධ පාඩුවක් වූ අතර , එයට අනුරූපව ඉකුත් වර්ෂයේ ලැබුණු රු.55,000,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු ශුද්ධ පාඩුව රු.3,145,965 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,617,867 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කර තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.96,920,918 ක් වූ අතර එයින් රු.48,669,700 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු වියදමෙන් සියයට 50 ක් නියෝජනය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන සමාලෝචනය

පහතසඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත විස්තර දැක්වෙන පරිදි මණ්ඩලයේ ආදර්ශ ගොවිපළවල් පහක් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,063,163 ක සමස්ත පාඩුවක් සහිතව පවත්වාගෙන ගොස් තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.3,084,332 ක් විය.

| ගොවිපළේ නම | මුළු ආදායම | මුළු පිරිවැය | ශුද්ධ පාඩුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කුඩ්ඩට්ටනායි | නැත | 475,675 | 475,675 |
| මාමුනෙයි | නැත | 759,630 | 759,630 |
| ඩෙල්ෆ්ට් | නැත | 61,180 | 61,180 |

| | | | |
|---|---|---|---|
| පුලියන්කුලම් | නැත | 808,704 | 808,704 |
| වීරවිල | 112,505 | 2,066,984 | 1,961,724 |
| | | | ------------ |
| | | | 4,063,163 |

(ආ) වීරවිල ආදර්ශ ගොවිපළ සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කර, මුළු පිරිවැයෙන් සියයට 93 ක් වැටුප් ගෙවා තිබු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එහි ආදායම රු.112,505 ක් වුවද, ඊට එරෙහිව රු.1,961,724 ක විශාල මෙහෙයුම් පාඩුවක් දරා තිබුණි.

(ඇ) පහත සඳහන් පරිදි අක්කර 567 ක මුළු ඉඩම් ප්‍රමාණයකින් යුතු ආදර්ශ ගොවිපළවල් 07 ක් මුළුමනින්ම නිෂ්කාර්යව තිබෙන්නට ඉඩහැර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| **ගොවිපළේ පිහිටීම** | **ඉඩම් ප්‍රමාණය** |
|---|---|
| | **(අක්කර )** |
| මාමුනෙයි | 436 |
| සින්ගයිනගර් | 50 |
| උට්රුපුලම් | 50 |
| කව්තාර්මුනෙයි | 10 |
| අරිවියල් නගර් | 07 |
| මුලන්කවිල් | 02 |
| නරවෙලික්කුලම් | 12 |
| | -------- |
| එකතුව | 567 |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහතසඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීරවිල ආදර්ශ ගොවිපළේ නිෂ්පාදනය කෙරෙන හස්ත කර්මාන්ත නිෂ්පාදිතයන් සඳහා තිස්සමහාරාමයේ විශාල ඉල්ලුමක් පැවතියද, තිස්සමහාරාම මධ්‍යස්ථානය විසින් එම වර්ගයේ සමාන නිෂ්පාදිතයන් විශාල ප්‍රවාහන පිරිවැයක් දරමින් කොළඹින් හා මඩකලපුවෙන් මිලදී ගෙන තිබුණි.

(ආ) තල් කොළ හස්ත කර්මාන්ත නිෂ්පාදිතයන් සඳහා තිස්සමහාරාමයේ විශාල ඉල්ලුමක් පැවතුණද, අතිරික්ත ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා එම අයිතමයන් සැපයීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) මිලදී ගන්නා ලද තල් බීජ 11,477 කින් බීජ 6,085 ක සංඛ්‍යාවක් 2012 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 18 ක් සඳහා බෙදාහැර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බීජ බෙදාහැරීම සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචිත වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රගති සමාලෝචන වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් තල් බීජ 5,392 ක තොග ශේෂ තත්ත්වය හා වගා කිරීමේ ප්‍රගතිය පිළිබඳව විගණනයේදී සාධාරණීකරණය කළ නොහැකි විය.

(ඇ) මණ්ඩලය විසින් පිරිවැය ඵලදායි ආකාරයෙන් සිදුකිරීමට ඵලදායී බෙදාහැරීම් ක්‍රමයක් යොදා ගෙන නොතිබු අතර රු.6,085 ක් වටිනා තල් බීජ බෙදා හැරීම සඳහා මණ්ඩලය විසින් රු.38,118 ක මුදලක් වැයකර තිබුණි.

(ඉ) රු.199,877 ක් වටිනා තල් බීජ 101,477 ක සංඛ්‍යාවක් විවිධ අවස්ථාවන්හි විවිධ මිල ගණන් වලට මිලදී ගැනීමට තල් සංවර්ධන මණ්ඩලයේ සම්බන්ධිකාරකවරුන්ට අවස්ථාව ලබාදී තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

---------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.1,868,644 ක් වටිනා සෙමින් චලනය වන, නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම් මණ්ඩලයේ මධ්‍යස්ථාන තුනක පැවති බව නිරීක්ෂණය විය.

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැනුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කිරීමෙන් තොරව හා පාලක මණ්ඩල අනුමැතියකින්ද තොරව කිලිනොච්චි ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඉඩම මැනීම සඳහා 2012 දෙසැම්බර් 08 දින බලයලත් මිනින්දෝරුවෙකුට හා කළමනාකරුවෙකුට රු.21,600 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඒකාකාර බවක් නොමැතිව තල් බීජ 57,000 ක් සම්බන්ධයෙන් පැටවීම් ගාස්තු හා බීජ රෝපණ ගාස්තු සඳහා රු.25,500 ක මුදලක් ගෙවා තිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

කල් බදු වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර සීමාසහිත වඩමාරච්චි තල් සංවර්ධන පොකුරු සමුපකාර සමිතිය (Vadamarachchi Palm Development cooperation Socicty Cluster Limited ) සමඟ එළඹී බදු ගිවිසුම ප්‍රකාරව තික්කම් ඩිස්ටිලර් ව්‍යාපෘතිය (Thickam Distillery Project ) සම්බන්ධයෙන් ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ මණ්ඩලය විසින් පසුගිය වර්ෂ 5 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. තවද, රාජ්‍ය භාගය හා බදු කුලී අයකර ගැනීමට කටයුතු නොකිරීම, එළඹී ගිවිසුම ප්‍රකාරව "තික්කම් ඩිස්ටිලර් ව්‍යාපෘතිය " ආපසු පවරා ගැනීමට නොහැකිවීම පිළිබඳව කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා කිසිවක්ද නොතිබුණි.

**3.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්**

කරෙයිනගර්හි කර්මාන්ත සංකීර්ණය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීමට 2003, 2004 හා 2012 වර්ෂ තුළදී රු.3,055,834 ක් වූ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. 2003 නොවැම්බර් 07 දිනට මෙම කාර්යය නිම කරන බවට එකඟවී තිබුණද, 2013 මැයි 31 වන විටත් වැඩ නිම කර නොතිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල විස්තර හා 2012 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු පහත දැක්වේ.

| මට්ටම / ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 01 | 01 |
| තෘතියික මට්ටම | 22 | 14 | 08 |
| ද්විතියික මට්ටම | 89 | 63 | 26 |
| ප්‍රාථමික මට්ටම | 111 | 72 | 39 |

| | | | |
|---|---|---|---|
| එකතුව | 224 | 150 | 74 |

## 3.8 වාහන උපයෝජනය

වාහන අළුත් වැඩියා හා නඩත්තුව සඳහා රු.758,284 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, එම අළුත් වැඩියා පිළිබඳ සටහන් කිරීමට මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව ලොග් පොත් පවත්වා නොතිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන විෂයයන්

බම්බලපිටිය කාර්යාල ගොඩනැගිල්ලේ තෙවැනි මහල සඳහා 2012 වර්ෂයේ කුලී වශයෙන් රු.4,980,000 ක මුදලක් ගෙවා තිබුණද, පසුගිය වර්ෂ 4 ක කාලයක් සඳහා මණ්ඩලය විසින් එම ගොඩනැගිල්ල උපයෝජනය කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

2012 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. කෙසේ වුවද ක්‍රියාකාර සැලැස්මේ උක්වා තිබු ඉලක්කයන් පිළිබඳ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

## 4.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණි. කෙසේ වුවද ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබු ඉලක්කයන් පිළිබඳ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර එක් අභ්‍යන්තර විගණකවරයකු පමණක් පත්කර තිබුණි. එසේ වුවද එම අංශයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා වෙනත් කිසිදු කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබුණි.

## 4.4 විගණන හා කළමනාකරණ කමිටුව

මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර 2012 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3 ක් පවත්වා තිබුණි. එසේ වුවද 2005 ජුලි 01 දිනැති අංක පීඊඩී/ 31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂයකට රැස්වීම් 4 ක් පැවැත්විය යුතුය.

## 4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

මුදල් පනතේ 14(3) වගන්තිය ප්‍රකාරව 2011 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2013 මැයි 31 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) වාහන උපයෝජනය
(උ) අයවැය